# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1992 අංක 5 දරන උක් පර්යේෂණ ආයතනය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 පෙබරවාරි මස 26 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී**

---

1992 පෙබරවාරි මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : ශත 45 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

1992 අංක 5 දරන උක් පර්යේෂණ ආයතනය (සංශෝධන)

[සහතිකය සටහන් කළේ 1992 පෙබරවාරි මස 26 වන දින]

එල්. ඩී.—ඕ. 7/91

## 1981 අංක 75 දරන උක් පර්යේෂණ ආයතනය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—**

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1992 අංක 5 දරන උක් පර්යේෂණ ආයතනය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**1981 අංක 75 දරන පනතේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.**

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 75 දරන උක් පර්යේෂණ ආයතනය පනතේ 17 වන වගන්තියේ (1) වන උප වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයෙහි "සියලුම මුදල් ප්‍රමාණයන් ; සහ" යන වචන වෙනුවට, "සියළුම මුදල් ප්‍රමාණයන් ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයෙහි "ආයතනයට ලැබිය හැකි සියලුම මුදල් ප්‍රමාණයන්" යන වචන වෙනුවට "ආයතනයට ලැබිය හැකි සියලුම මුදල් ප්‍රමාණයන් ; සහ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඇ) ඒ උපවගන්තියේ අවසානයට පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(ඈ) මේ පනත යටතේ උක් සම්බන්ධයෙන් සෙස් බද්දක් වශයෙන් ලැබිය හැකි වූ හෝ අය කර ගත හැකි වූ සියළුම මුදල් ප්‍රමාණයන්.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 18අ සහ 18ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.**

3. 18 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 18අ සහ 18ආ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"ආනයනය කරන ලද සීනි වෙනුවෙන් සෙස් බද්දක් අය කිරීම.

18අ (1) මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් කලින් කල නිශ්චිය කරනු ලැබිය හැකි යම් අනුපාතිකවලට අනුව, ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන සෑම සීනි කිලෝ ග්‍රෑම් එකක් සම්බන්ධයෙන් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් සෙස් බද්දක් අය කිරීම, පැනවීම සහ ගෙවීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, නැවත අපනයනය කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවට ආනයන කරන ලදැයි රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලැබ ඇති යම් සීනි ප්‍රමාණයක්

සම්බන්ධයෙන්, එවැනි යම් සෙස් බද්දක් අය කිරීම, පැනවීම හෝ ගෙවීම කරනු නොලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ බලපෑම, එය රේගු ආඥා පනතේ කොටසක් වශයෙන් සකස් වී ඇති පරිද්දෙන් තිබිය යුතු අතර, ඒ ආඥාපනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ ආනයනය කරනු ලබන සීනි සම්බන්ධයෙන් අය කරන සෙස් බද්ද වෙනයම් ලිඛිත නීතියක් යටතේ ආනයනය කරන ලද සීනි සම්බන්ධයෙන් අය කරන වෙනත් යම් සෙස් බද්දකට හෝ තීරු ගාස්තුවකට අමතරව විය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියමයක්ම, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින හෝ එහි සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක බලාත්මක විය යුතු අතර, එය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින පටන් මාස හතරක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකරන ලද එවැනි යම් නියමයක්, ඒ යටතේ කලින් කරන ලද යම් දෙයක වලංගු භාවයට හානියක් නොමැතිව, ඒ අනනුමතයේ දින පටන් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

18අ වගන්තිය යටතේ අය කරන ලද සෙස් බද්දෙන් ලත් මුදල් ආයතනයේ අරමුදලට බැර කළ යුතු බව.

18ආ. 18අ වගන්තිය යටතේ අය කරන ලද සෙස් බද්ද රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍යවරයා හිමිසා බලය දෙන ලද වෙනත් යම් පුද්ගලයකු විසින් හෝ අය කර ගත යුතු අතර, ඔහු විසින් ඒ බද්ද පනත යටතේ පිහිටුවන ලද ආයතනයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.".

4. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.